සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) සිදුහත් බෝසතාණන් 'කිං කුසලගවේසිව' සිටි කාලයේ පළමුව සොයා ගිය සප්තසමාපත්තිලාභි තවුසා වන්නේ,
1. කාලදේවල තවුසා
2. උද්දකරාමපුත්ත තවුසා
3. ආලාර කාලාම තවුසා
4. භග්ගව තවුසා

02. සංග්‍රාම භූමියක සිටි ඇතෙකුට සතුරන්ගෙන් කොතරම් හී පහර වැදුණ ද පසුපසට නොයන්නා සේ නින්දා ප්‍රශංසා හමුවේ නොසැලී ඉදිරියට යාමේ හැකියාවක් බුදුන් වහන්සේට විය. මෙය,
1. තාදී ගුණය නම් වේ.
2. පුරිසදම්ම සාරථී ගුණය නම් වේ.
3. මහා කරුණා ගුණය නම් වේ.
4. යථාවාදී තථාකාරී ගුණය නම් වේ.

03. පන්සාළිස් වසක් වූ බුදු සිරිතේ මූලික ප්‍රත්‍ය පහසුකම් නොලැබුණ දුෂ්කර කාලසීමාවක් වන්නේ,
1. උරුවේලාවේ වැඩ විසූ කාලය යි.
2. පාරිලෙය්‍ය වනයේ වැඩ විසූ කාලය යි.
3. භේෂකලා වනයේ වැඩ විසූ කාලය යි.
4. වේරංජාවේ වැඩ විසූ කාලය යි.

04 තමා විසින්ම පිළිපැද ඇස් පනාපිට ම මෙලොව දී ම ප්‍රතිඵල දැකගත හැකි බව හඳුන්වන ගුණය වන්නේ,
1. සුගත
2. සන්දිට්ඨික
3. සුපටිපන්න
4. අකාලික

05. උස් හඬින් කතා කළහොත් බුදුරජාණන් වහන්සේ තම අසපුවට වැඩම නොකරාවි යැයි කියා තම සිසුන් නිශ්ශබ්ද කරනු ලැබුවේ,
1. උපක ආජීවකයා
2. සෝණදණ්ඩ බමුණා
3. පොට්ඨපාද පිරිවැජියා
4. සංජය පිරිවැජියා

06. බුදුන් වහන්සේගේ රූප සම්පත්තිය දැක උන්වහන්සේ අනුගමනය කිරීමට යොමු වූ භික්ෂුව වන්නේ,
1. වක්කලී හිමි
2. ධම්මාරාම හිමි
3. ආනන්ද හිමි
4. අනුරුද්ධ හිමි

07. බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රයේ සුවිසි ගුණ ශිෂ්‍ය ජීවිතය සාර්ථකත්වයට උපයෝගී කරගත හැක්කේ එම ගුණ,
1. ඉගෙනීමෙනි.
2. සජ්ඣායනා කිරීමෙනි.
3. චරිතායනය කිරීමෙනි.
4. අන් අයට කියා දීමෙනි.

08. බුදුරජාණන් වහන්සේ පිප්ඵලී ගුහාවට වැඩම කර සප්ත බොජ්ඣංග සූත්‍රය දේශනා කළේ,
1. පූතිගත්තතිස්ස හිමියන්ට
2. මහා කාශ්‍යප හිමියන්ට
3. ආනන්ද හිමියන්ට
4. ගිරිමානන්ද හිමියන්ට

09. සාමඤ්ඤඵල සූත්‍රයට අනුව සිරගෙයක දුක්විඳින්නෙකුට උපමා කර ඇති නීවරණය වන්නේ,
1. කාමච්ඡන්දය
2. ව්‍යාපාදය
3. ථීනමිද්ධය
4. උද්ධච්ච කුක්කුච්ච

10. නැවත නැවත මැරී මැරී ඉපදී සැරිසරන පුහුදුන් සත්වයාගේ මතු පැවැත්ම දැකිය හැකි නුවණ හැඳින්වෙන්නේ,
    1. පුබ්බේනිවාසානුස්සති ඥානය
    2. චුතුපපාත ඥානය
    3. ආසවක්ඛය ඥානය
    4. පරචිත්ත විජානන ඥානය

11. මාස ගණනක් බුදුරජාණන් වහන්සේ සමග එකට සිටිමින් උන්වහන්සේගේ පැවැත්ම පරීක්ෂා කළේ,
    1. සෝණදණ්ඩ බමුණා
    2. බ්‍රහ්මායු බමුණා
    3. ද්‍රෝණ බමුණා
    4. හුහුංක බමුණා

12. පුද්ගලයාගේ චින්තනය හා විමංසනය පිළිබඳ නිදහස අගය කරමින් බුදුන් වහන්සේ කේසපුත්ත ගම්වාසීන්ට දේශනා කළ සූත්‍රය වන්නේ,
    1. වීමංසක සූත්‍රය
    2. ව්‍යග්ගපජ්ජ සූත්‍රය
    3. මහා මංගල සූත්‍රය
    4. කාලාම සූත්‍රය

13. ත්‍රිවිධ රත්නයේ ගුණ නුවණින් දැන ඇති කර ගන්නා පැහැදීම ධර්මයේ හැඳින්වෙන්නේ,
    1. අවෙච්චප්පසාදය ලෙසයි
    2. අමූලිකා ශ්‍රද්ධාව ලෙසයි
    3. අචල භක්තිය ලෙසයි
    4. බුද්ධි ගෝචර නොවන ශ්‍රද්ධාව ලෙසයි

14. නාමරූප ධර්ම හේතු කරගෙන ආයතන හය (ෂඩායතන) ඇති වන බව පටිච්ච සමුප්පාදයේ දැක්වේ. එම ආයතන හය වන්නේ,
    1. පඨවි, ආපො, තේජො, වායෝ, ආකාස, සමුද්‍ර
    2. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම
    3. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන
    4. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, නාම

15. චූල්ලකම්ම විභංග සූත්‍රයේ දැක්වෙන පරිදි අන් සැපතට ඊර්ෂ්‍යා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය වන්නේ,
    1. මහේශාක්‍යව ඉපදීම යි
    2. අඩු වයසින් මිය යාම යි
    3. පහත් යැයි සම්මත කුලවල ඉපදීම යි
    4. අල්පේශාක්‍යව ඉපදීම යි

16. 'ප්‍රතිසන්ධි සිත හේතු කොට ගෙන පංචස්කන්ධය ඇති වේ' යන්න අනුලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ,
    1. 'අවිජ්ජා පච්චයා සංඛාර' යන්න යි
    2. 'විඤ්ඤාණ පච්චයා නාමරූප' යන්න යි
    3. 'නාම රූප පච්චයා සලායතනං' යන්න යි
    4. 'සංඛාර පච්චයා විඤ්ඤාණං' යන්න යි

17. දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාවිය හැක්කේ,
    1. ගති සම්පත්තියෙනි
    2. කාල සම්පත්තියෙනි
    3. උපධි සම්පත්තියෙනි
    4. ප්‍රයෝග සම්පත්තියෙනි

18. 'මහණෙනි, දුප්පතුන්ට ධනය නූපදනා කළ දිළිඳුකම වැඩිවේ' යනාදි වශයෙන් හේතුඵල දහම අනුව සමාජ ගැටලු ඇතිවන ආකාරය පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍ර ධර්මය වන්නේ,
    1. චක්කවත්තී සීහනාද සූත්‍රය
    2. මහා නිදාන සූත්‍රය
    3. සාමඤ්ඤඵල සූත්‍රය
    4. බ්‍රහ්මජාල සූත්‍රය

19. දස අකුසල් අතර මනෝ කම්ම ගණයට අයත් නොවන අකුසලය වන්නේ,
    1. ව්‍යාපාද
    2. අභිධ්‍යා
    3. මිථ්‍යා දෘෂ්ටි
    4. විචිකිච්ඡා

20. 'යම් ක්‍රියාවක් කිරීමෙන් පසුතැවෙන්නට සිදුවේද, විපාකය කඳුළු පිරි මුහුණින් යුතුව අඬමින් විඳින්නට සිදු වේද එබඳු ක්‍රියා නොකිරීම යහපත්ය.'' යන අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
    1. 'තං ච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති' යන්නයි.
    2. 'නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති' යන්නයි.
    3. 'සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච' යන්නයි.
    4. 'අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මේ' යන්නයි.

21. බුදුරජාණන් වහන්සේ ඇට්ටේරියා වනයක දී දේශනා කළ සූත්‍රය වන්නේ,
    1. වේදනා පරිග්‍රහ සූත්‍රය  2. සාමඤ්ඤඵල සූත්‍රය
    3. සිංසපා සූත්‍රය  4. තේවිජ්ජ සූත්‍රය

22. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව ප්‍රකාශ කළ ප්‍රථම උදාන වාක්‍යයෙන් දුක් සහිත පංචස්කන්ධය නමැති ගෘහය නිර්මාණය කරන අදෘශ්‍යමාන බලවේගය ලෙස හඳුන්වන්නේ,
    1. වේදනාව යි.  2. තෘෂ්ණාව යි.  3. අවිද්‍යාව යි.  4. විඤ්ඤාණය යි.

23. භද්දාලිය සූත්‍රයට අනුව ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීම නිසා ලැබෙන යහපත් ප්‍රතිඵලයක් නොවන්නේ,
    1. කාය බලය  2. නිදුක් බව  3. සුවපහසු පැවැත්ම  4. මානසික බලය

24. සිඟාලෝවාද සූත්‍රයට අනුව සේව්‍යයා විසින් සේවකයාට ඉටු කළ යුතුකම් අතරට අයත් නොවන කරුණ වන්නේ,
    1. අවමන් නොකිරීම.  2. ශක්ති ප්‍රමාණයට වැඩ පැවරීම.
    3. සෞඛ්‍ය පහසුකම් ලබා දීම.  4. මිහිරි ආහාර පාන බෙදා දීම.

25. ගිහි ජීවිතය හා සම්බන්ධව සැලකීමේ දී ජීවිත හා දේපල ආරක්ෂා වීම පවුල් ජීවිතයේ සාමය හා සතුට ඇති වීම, මනා සිහි බුද්ධිය හා සෞඛ්‍ය ඇති වීම යන කරුණු සුරක්ෂිත වන්නේ,
    1. දස පින් කිරියවත්වල යෙදීමෙනි.  2. ත්‍රිවිධ පූජා ක්‍රියාවල යෙදීමෙනි.
    3. පංචශීල ප්‍රතිපත්තියේ යෙදීමෙනි.  4. සතර සංග්‍රහ වස්තුවල යෙදීමෙනි.

26. අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම,
    1. සමානාත්මතාවය යි.  2. අර්ථචර්යාව යි.
    3. පරාර්ථචර්යාව යි.  4. යහපාලනය යි.

27. රාජ්‍ය පාලකයකුට තම ජනතාවගේ දියුණුව හා සතුට දැක අවංකවම සතුටු වීමේ හැකියාව,
    1. මෙත්තාව යි.  2. කරුණාව යි.  3. උපේක්ෂාව යි.  4. මුදිතාව යි.

28. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් පරිදි නැගිට ගැනීමටත් බැරි තරමට ආහාර ගෙන එහිම පෙරළි සිටින්නා,
    1. තත්ථාවට්ටක නම් වේ.  2. ආහාර හත්ථක නම් වේ.
    3. කාකමාසක නම් වේ.  4. භුත්ත වමිතක නම් වේ.

29. ''බුදුන් සරණ යමියි බුත්සරණ යා යුතු'' යනුවෙන් සෑම ඡේදයක් අවසානයේ දක්වමින් බුදුගුණ වර්ණනා කරමින් 'අමෘතාවහ' නම් ග්‍රන්ථය රචනා කළ කතුවරයා වන්නේ,
    1. ගුරුළුගෝමී පඬිතුමා ය.  2. බුද්ධ පුත්‍ර හිමියන් ය.
    3. ධර්මසේන හිමියන් ය.  4. විද්‍යා චක්‍රවර්ති පඬිතුමා ය.

30. ''ලාභෝ අලාභෝ අයසෝ යසෝච'' යන ගාථාවෙන් දැක්වෙන්නේ,
    1. හේතුඵල දහම පිළිබඳව යි.  2. අටලෝ දහම පිළිබඳව යි.
    3. අෂ්ඨ විද්‍යා පිළිබඳව යි.  4. සමානාත්මතාව පිළිබඳව යි.

31. බුදුරජාණන් වහන්සේ සිත්කලු ස්ථාන ලෙස වර්ණනා කරන ලද නිග්‍රෝධය, චෞර ප්‍රපාතය, කාලසිලාව, තපෝදාරාමය වැනි ස්ථාන පිහිටියේ,
    1. විශාල මහනුවර  2. රජගහ නුවර  3. කුසිනාරා නුවර  4. සැවැත් නුවර

32. පළමු ධර්ම සංගායනාවෙන් පසු සසුනේ සුරක්ෂිතභාවය ඇති කිරීමට ධර්ම කොටස් මුඛ පරම්පරාගතව රැගෙන යාමට භාණක පරම්පරාවට භාර දුනි. ඒ අනුව සංයුක්ත නිකාය භාර දෙනු ලැබුවේ,
   1. මහා කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට
   2. සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට
   3. ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට
   4. අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට

33. දෙවන හා තෙවන ථෙරවාද ධර්ම සංගායනා සඳහා අනුග්‍රාහක දායකත්වය ලබා දුන් පාලකයන් දෙදෙනා වන්නේ,
   1. අජාසත්ත හා ධර්මාශෝක රජවරුන් ය.
   2. කාලශෝක හා කණිෂ්ක රජවරුන් ය.
   3. කාලශෝක හා ධර්මාශෝකය රජවරුන් ය.
   4. අජාසත්ත හා කාලාශේක රජවරුන් ය.

34. බුදුරජාණන් වහන්සේ දෙව්ලොව සිට සංකස්ස පුරයට වැඩම කිරීම චිත්‍රයට නගා ඇති පොළොන්නරු යුගයට අයත් පූජනීය ස්ථානය වන්නේ,
   1. හිඳගල විහාරය
   2. තිවංක පිළිමගෙය
   3. මැදවල විහාරය
   4. දිඹුලාගල ලෙන් විහාරය

35. සප්ත අපරිහාණිය ධර්මවලට අයත් නොවන කරුණ වන්නේ,
   1. කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම.
   2. වැඩිහිටියන්ට හා ඔවුන්ගේ අදහස්වලට ගරු කිරීම.
   3. තම රාජ්‍යයට පැමිණෙන පූජනිය උතුමන්ට පහසුකම් සැලසීම.
   4. දිළින්දන්ට ධනය දීම.

36. ගර්භයේ හැඩය නෙල්ලි ගෙඩියක ස්වරූපයෙන් ගොඩනංවන ලද ස්තූප හැඳින්වෙන්නේ,
   1. ආමලාකාකාර ස්තූප ලෙස ය.
   2. ඝණ්ඨාකාර ස්තූප ලෙස ය.
   3. ඝටාකාර ස්තූප ලෙස ය.
   4. බුබ්බුලාකාර ස්තූප ලෙස ය.

37. එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම (PALI TEXT SOCIETY) පිහිටුවා ත්‍රිපිටකය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලද්දේ,
   1. අනගාරික ධර්මපාල තුමා ය.
   2. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය.
   3. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය.
   4. රීස් ඩේවිඩ් පඬිතුමා ය.

38. බුදුරජාණන් වහන්සේ ගිරිමානන්ද හිමියන්ට රෝග වැළදීමට හේතුන් අටක් දේශනා කළහ. එම කරුණු අතරට අයත් නොවන්නේ,
   1. ලේ ධාතුව කිපීම
   2. පිත් ධාතුව කිපීම
   3. කර්ම විපාක අනුව
   4. ඍතු විපර්යාස අනුව

39. 'මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස නිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය'' මේ පාඨය ඇතිව කටයුතු කළ පාලකයා වන්නේ,
   1. වළගම්බා රජු ය.
   2. ධාතුසේන රජු ය.
   3. දුටුගැමුණු රජු ය.
   4. මහා පරාක්‍රමබාහු රජු ය.

40. පරලොවක් නැත යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව,
   1. කාම තණ්හාවයි.
   2. භව තණ්හාවයි.
   3. විභව තණ්හාවයි.
   4. රස තණ්හාවයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**11 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය - II** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. (i) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වීමෙන් පසු කළ ප්‍රථම උදාන වාක්‍යයට අයත් ගාථාවේ මුල් පද දෙක ලියන්න.

(ii) තුන්තරා බෝධිය නම් කරන්න.

(iii) ලෝකය හා ජීවිතය පිළිබඳ ඇති කර ගත හැකි දෙයාකාර අවබෝධය නම් කරන්න.

(iv) මඛාදේව ජාතකයෙ හි ප්‍රකට කරන්නේ අප මහා බෝසතාණන් වහන්සේ සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?

(v) ''එහි පස්සිකෝ'' යන දහම් ගුණයෙහි අර්ථය ලියන්න.

(vi) 'අක්කෝධේන ජිනේ කෝධං - අසාධුං සාධුනා ජිනේ' යන ගාථා පාඨයේ සඳහන් තේරුම ලියන්න.

(vii) වැලිවිට සරණංකර සඟරජ හිමි රචිත ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(viii) සතර සතිපට්ඨානයෙන් දෙකක් නම් කරන්න.

(ix) කණිෂ්ක ධර්ම සංගායනාවේ ප්‍රතිඵල දෙකක් නම් කරන්න.

(x) 'සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවා' යන පැතුම ඇතිව සිහිනුවණින් අපවත් වූයේ කවුරුන්ද?

(ලකුණු 2X10 =20)

02. (i) පංචමහා විලෝකන නම් කරන්න.

(ii) සිදුහත් කුමරුන්ට තිබූ අභියෝග තුනක් ලියන්න.

(iii) ශිෂ්‍යයකු වශයෙන් අභියෝග ජයගෙන යහපත් පුරවැසියෙකු වන අයුරු විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

03. (i) 'උට්ඨානවතෝ සතිමතෝ' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) ඉහත සඳහන් ගාථාවේ තේරුම ලියන්න.

(iii) ධම්මපදය උපදේශාත්මක ග්‍රන්ථයක් වන්නේ ඇයි දැයි පහදන්න.

(ලකුණු 2+3+5 = 10)

04. (i) 'අනුසෝතගාමී' හා 'පටිසෝතගාමී' යන වචන දෙකෙහි අර්ථය ලියන්න.

(ii) බුදු සිරිත පද්මාකාර ජීවිතයක් ලෙස හඳුන්වන්නේ ඇයි දැයි පෙන්වා දෙන්න.

(iii) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ ගෙනහැර දක්වන්න.

(ලකුණු 2+3+5 = 10)

05. (i) ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ සඳහන් පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන කරුණු දෙකක් දක්වන්න.

(ii) ඉහත සඳහන් කළ එක් කරුණක් පැහැදිලි කරන්න.

(iii) පුද්ගලයාගේ මෙලොව පරලොව දියුණුව උදෙසා මහා මංගල සූත්‍රයේ කරුණු ඉවහල් වන ආකාරය පහදන්න.

(ලකුණු 2+3+5 = 10)

06. (i) පුස්තකාරූඪ සංගීතිය යන්නෙහි අර්ථය කෙටියෙන් ලියන්න.

(ii) පුස්තකාරූඪ සංගීතියට බලපෑ හේතු තුනක් ලියන්න.

(iii) ධර්ම විනයේ සුරක්ෂිතභාවය උදෙසා මෙම සංගායනයේ ප්‍රතිඵල බලපෑ අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) රේරුකානේ චන්දවිමල හිමි (ii) විපස්සනා භාවනාව

(iii) මුරගල (iv) ප්‍රඥා පාරමිතාව

(ලකුණු 5+5 = 10)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2025**

**II ශ්‍රේණිය** **බුද්ධ ධර්මය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(4) | 4 -(2) | 5 -(3) | 6 -(1) | 7 -(3) | 8 -(2) | 9 -(4) | 10 -(1) |
| 11-(2) | 12 -(4) | 13 -(1) | 14 -(3) | 15 -(4) | 16 -(2) | 17 -(3) | 18 -(1) | 19 -(4) | 20 -(2) |
| 21-(3) | 22 -(2) | 23 -(4) | 24 -(1) | 25 -(3) | 26 -(2) | 27 -(4) | 28 -(1) | 29 -(4) | 30 -(2) |
| 31-(2) | 32 -(1) | 33 -(3) | 34 -(2) | 35 -(4) | 36 -(1) | 37 -(4) | 38 -(1) | 39 -(3) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

01. i. අනේකජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං

ii. සම්මා සම්බුද්ධ / බුදු පච්චේක බුද්ධ / පසේ බුදු අරහත්ථ බුද්ධ / මහරහත්

iii. සම්මුති සත්‍යාවබෝධය පරමාර්ථ සත්‍යාවබෝධය

iv. නෙක්ඛම්ම පාරමිතාව

v. ශ්‍රී සද්ධර්ම ගැන සැකයකින් තොරව ඒනන ඇවිත් බලන්න යැයි නිර්භයව ප්‍රකාශ කළ හැකි නිසා යහපත කිරීමෙන් ජයගත යුතුය.

vi. ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නොකිරීමෙන් ජයගත යුතුය. අයහපත කරන්නා යහපත කිරීමෙන් ජයගත යුතුය.

vii. මුණිගුණ අලංකාරය, සාරාර්ථ, සංග්‍රහය, සතර බණවර සන්නස, රතනත්‍රය පුණම ගාථා සන්නය

viii. කායානුපස්සනා, වේදනානු පස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා

ix. සූත්‍ර, විනය, අභිධර්ම යන ත්‍රිපිටයකය විභාශා ග්‍රන්ථවලට සම්පාදනය වීම, අටුවා ග්‍රන්ථ සෙල්මුවා මංජුසාවක බහා ස්ථූපයක තැන්පත් කිරීම / පාලි ත්‍රිපිටකය සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම මහායාන සම්ප්‍රදාය ඇරඹීම / මධ්‍යාසියාවේ ධර්ම ප්‍රචාරය

x. අනගාරික ධර්මපාලතුමා (ලකුණු 2X10 =20)

02. i. කාලය, දීපය, දේශය, කුලය, මව (පිළිතුරු පහම ලියා ඇත්නම් ලකුණු 02 ක් ද නැතිනම් 01 ලකුණක් ද)

ii. උපත, ශිල්ප හැදෑරීම, මව කළුරිය කිරීම, ගිහිගෙය හැර යාම, පස්කම් සැප අත්හැරීම

iii. ශිෂ්‍ය ජිවිතය තුළ නිසියාකාරව අධ්‍යාපනය හැදෑරීම,
යහපත් ගුණගරුක වලින් යුත් දරුවෙකු වීම, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, මෛත්‍රී සිතුවිලි ප්‍රගුණ කිරීම මෙන් ම වෛරයෙන් තොරව කටයුතු කිරීම යනාදි අභියෝග විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

03. i. උට්ඨානවතො සතිමතො
සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො
අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති

ii. උත්සාහයෙන් නිවැරදි සිහියෙන් නිදොස් දේ විමසා බලා කරන තැන්පත් දැහැමි දිවි පැවතුම් ඇති නොපමා වූ පුද්ගලයාගේ කීර්තිය වැඩෙයි.

iii. ධම්මපදය සූත්‍රය පිටකයේ බුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් වන අතර බෞද්ධයාගේ අත්පොත ලෙස ද හඳුන්වයි. ගාථා 423, වග්ග 26, නිදාන කතා 299 ක් ඇත. ධම්මපදය කෙටියෙන් හඳුන්වා ගථා 3 ක්වත් ඇතුළත් වන සේ පිළිතුර ගොඩනගා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2+3+5 = 10)

04. i. අනුසෝතගාමී - ගඟක් පහළට ගලන්නා සේ මිනිසුන් රාගයෙන් රාගයට, ද්වේශයෙන් ද්වේශයට මෝහයෙන් මෝහයට යාමයි.
පටිසෝතගාමී - පහළට ගලන ගඟේ උඩුගං බලා යන්නා සේ වෛර කරන්නවුන් අතර අවෛරීව සිටීම. රාගාදී කෙලෙස් ඇත්නම් අතර කෙලෙස් වලින් තොරව ජීවත් වීම

ii. නෙළුම මලක් මඩෙහි ඉපදවී මඩෙන් ඉහළට එස වී මඩෙහි නොගැවී පිපෙන්නා සේ බුදුන් වහන්සේ කෙලෙස් සහිත සමාජයේ ඉපදී කෙලෙස් ප්‍රහිරා කර සිටි හෙයින් කියනු ලැබේ.

iii. මිනිසුන් පවට නැඹුරු වී ලෝභ ද්වේශ මෝහ ආදි සිතුවිලිවලින් යුක්තව විවිධ අපරාධවල නිරත වන අතර අපගේ වගකීම වනුයේ එවැනි වැරදි කරන්නාවුන් අතර නිවැරදි දේ කිරීමයි. අපිරිසිදු සිත් ඇති අය අතර පිරිසිදු සිත් වලින් යුක්තව වාදය කිරීමයි. එය බුද්ධා දී උතුමන්ගේ ආදර්ශයයි. සමාජයේ වන අපරාධ කිහිපයක් දක්වා ඒවායින් තොරව නිවැරදි ලෙස ජීවත් වන ආකාරය විස්තර කිරීමක් බුද්ධ චරිතය තුළ ද නින්දා අපහාස වැනි දෑ හමුවේ නොසැලී සිටිමින් ආදී විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2+3+5 = 10)

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

5. i. උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාන මිත්තතා, සමජීවිකතා

ii. උට්ඨාන සම්පදා - උත්සහයෙන්, වීර්යෙන් දහදිය වගුරුවා ධාර්මිකව ධනය ඉපයීම, කළ යුතු රැකියා, නොකළ යුතු රැකියා දක්වා තිබීම

ආරක්ඛ සම්පදා - ධාර්මික ඉපයූ ධනය ගින්නෙන්, ජලයෙන්, රජයට ගෙවන බදු වලින්, සොරුන්ගෙන් රැක ගැනීම

කල්‍යාණ මිත්ත්‍රයා - කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කිරීම කල්‍යාණ මිත්‍රයකු සතුව සද්ධා, සීල, චාග, පඤ්ඤා යන ගුණාංග තිබීම

iii. පුද්ගලයෙකුගේ දියුණුව හේතුවන කරුණු ඇතුළත් සූත්‍ර දේශනාවක් ලෙස මහා මංගල සූත්‍රය දැක්විය හැකිය. දෙවියන් උදෙසා දේශනා කළ මෙහි මංගල කරුණු 38 ක් ඇති අතර ලෞකික කරුණු 30 ක් ලෝකෝත්තර කරුණු 8 ක් ඇත. එහි සඳහන් මංගල කරුණු කිහිපයක් නම් කර (5 ක් වත්) ඒවා දියුණුවට හේතුවන ආකාරය පහදා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2+3+5 = 10)

6. i. ත්‍රිපිටකය පුස්කොළ පොත්වල රචනා වීම

ii. වළගම්බා රාජ්‍ය සමය යුධ ගැටුම්වලින් පිරි එකක් නිසා ධර්මය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව / බැමිණිතියා සාගතය නිසා ධර්මය කටපාඩමින් ගෙනා දා භික්ෂූන් අපවත් වීම / ලක්දිව ඇතැම් භික්ෂූන්ගේ ශාසනික පිළිවෙත් ගිලිහී යාම / ග්‍රන්ථ ධූරය ..... විදර්ශනා ධූරය වඩන ලෙස භික්ෂූන් දෙපිරිසකට බෙදීම / ධර්මය ඇසීමට හා ඉගෙනීමට වූ උනන්දුව

iii. වාචෝද්ගතව පැවති ත්‍රිපිටකය පුස්කොළ පොත්වල රචනා වීම නිසා ධර්මය ආරක්ෂා වීම, ථෙරවාදී බුදු දහම අභාවයට ගියහොත් එය ස්ථාපිත කිරීමට මෙම ග්‍රන්ථ උපකාරී වීම, රීස් ඩේවිඩ් පාලි ග්‍රන්ථ සමාගම පිහිටුවා ත්‍රිපිටකය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම ආදී ප්‍රතිඵල යහපත් කර එම ප්‍රතිඵල මත බුදු සසුන ආරක්ෂා වී ඇති අයුරු දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

07. i. රේරුකාගේ චන්ද්‍රවිමල හිමි

රේරුකාගේ චන්ද්‍රවිමල හිමිගේ ගිහි කළ විස්තර නම, පවුලේ විස්තර (රූබෙල් ගුණවර්ධන) සඳහන් කර යූ. විනයාලංකාර හිමිගේ මහපෙන්වීම මත පැවිදි වී බුරුමයට ගොස් ධම්මිකාරාමයේ දී උපසම්පදා විය. නැවත ලංකාවට වැඩම කර පාලි, සංස්කෘතිය වැනි විෂයන් හදාරා පොහොය දිනය, ධර්ම විනිශ්චය, බෞද්ධයාගේ අත්පොත, අභිධර්ම ප්‍රකරණය වැනි ග්‍රන්ථ රචනා කිරීමත්, ඉන් පසු උන්වහන්සේ ලබාගත් සම්මාන පණ්ඩිත, සාහිත්‍ය චක්‍රවර්ථි, ශ්වේජින් නිකායේ මහානායක පදවිය, අමරපුර මහා මහෝපාධ්‍ය ශාසන ශෝභන යන ගෞරව නාම ලබා ගැනීම, උන්වහන්සේ ආදර්ශ යනාදිය සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

ii. විපස්සනා භාවනාව

බුදු දහමේ ප්‍රධාන භාවනා ක්‍රමයකි. පංචස්කන්ධය පිළිබඳ විශේෂයෙන් ඇත්ත ඇති සැටියෙන් දැකීම, විපස්සනා භාවනාවෙන් ප්‍රඥාව දියුණු කිරීම, ප්‍රඥා භාවනාව, ත්‍රිලක්ෂණ භාවනාව, විදර්ශනා යන නම්වලින් හැඳින්වීම. විපස්සනා භාවනාව හේතුවෙන් ත්‍රිලක්ෂණ අවබෝධ වීම යනාදිය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දීම.

iii. මුරගල

මහින්දාගමනයෙන් පසු ලද ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව ආශ්‍රිත කලා නිර්මාණයක් ලෙස මුරගල ලෙස හැඳින්විය හැකිය. විහාර මන්දරයක හෝ රාජකීය ගොඩනැගිල්ලක දොරටු අලංකාර කරන අර්ධකවාකාර ගල්පුවරුවයි. මුරගලේ මුල් කාලයේ කැටයම් රහිත වුවත් පසුව වාමන රූප, නාග රූප ආදිය තිබුණි. මුරගලේ දියුණුව අවස්ථාව මිනිස් වෙස්ගත් හා රජුගේ කැටයම සහිත මුරගලය කලාත්මකව මුරගල අභයගිරියේ රත්නප්‍රසාදයේ පිහිටා ඇත. යනාදි කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iv. ප්‍රඥා පරම්පරාව

පාරමිතා යනු නිවනට පමුණුවන පිළිවෙත් වන අතර පාරමිතා 10 කි. ඒවා අතර ප්‍රඥා පාරමිතාව සුවිශේෂි වේ. ජීවිතය හා ලෝකය පිළිබඳ ඇති තතු වටහා ගැනීම ප්‍රඥාවයි. ප්‍රඥාව ලෞකික හා ලෝකෝත්තර ලෙස දෙයාකාරය. ප්‍රඥාව දියුණු කරන ක්‍රම 3 කි. චින්තාමය, සුතමය, භාවනාමය ලෙස වේ. බුදුන් වහන්සේ ප්‍රඥා පාරමිතාව උමග්ග ජාතකයේ ප්‍රකට වේ. ප්‍රඥාව පාරමිතාවක් ලෙස පිරීමේ දී එය ත්‍රිවිධාකාර වේ. ප්‍රඥා පාරමී, ප්‍රඥා උප පාරමී, ප්‍රඥා පරමත්ථ පාරමී ලෙස එය ත්‍රිවිධාකාරය යනාදී කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 5+5 = 10)